කෘෂිකර්ම අමාත්‍යාංශය

விவசாய அமைச்சு

**Ministry of Agriculture**

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

# இலங்கை ஹதபிம அதிகாரசபை

# HADABIMA AUTHORITY OF SRI LANKA







**වාර්ෂික වාර්තාව - 2014**

வருடாந்த அறிக்கை - 2014

ANNUAL REPORT - 2014



# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

## වාර්ෂික වාර්තාව - 2014

තැ.පෙ. 09, ගන්නෝරුව, පේරාදෙණිය.

දුරකථන : 0812-388107

ෆැක්ස් : 0812-388132

විද්‍යුත් තැපෑල : authority@hadabima@gmail.com

වෙබ් අඩවිය : www.hadabima.gov.lk

# පටුන

පිටු අංක


01. ගරු සභාපතිතුමාගේ පණිවිඩය 1

02. විධායක අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය 2

03. දැක්ම හා මෙහෙවර 3

04. හැඳින්වීම 4-5

05. පාලන අංශයේ තොරතුරු 6-9

- පාලන අංශය - ආයතනික තොරතුරු 6
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වූ දින 7
- අනුමත සේවක සංඛ්‍යාව 8
- සංවිධාන සටහන 9

06. 2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන 10-24

- 2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහනෙහි සාරාංශය 10
- පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමණාකරණය 11-14
- ඉඩම් බෝග කළමණාකරණ වැඩසටහන 15
- කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන 16
- අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන 17
- පාසැල් පාරිසරික වැඩසටහන 17-18
- "තරුණ අරුණ" ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන 18
- කෘෂි නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධන වැඩසටහන 19
- මාධ්‍ය, ප්‍රචාරක වැඩසටහන්, ප්‍රගති මෙහෙයුම් හා ආයතනික සංවර්ධනය 20
- විශේෂ සංවර්ධන ව්‍යාපෘති 21-24

07. අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය 25-31

08. ගිණුම් තොරතුරු 32-41

09. විගණන තොරතුරු

- විගණකාධිපති වාර්තාව 42-47



**සභාපතිතුමාගේ පණිවිඩය**

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික නීතිගත සංස්ථා පනත අනුව ස්ථාපිත ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ 2014 වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

2014 වර්ෂයේ ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 40 ක ගොවි පවුල් 12500 ට අයත් ඉඩම් හෙක්ටෙයාර 4000 ක ප්‍රමාණයක් සංරක්ෂණය කර සංවර්ධනය කිරිම ඉලක්ක ගත විය.

ඒ අනුව අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රමුඛතම සංවර්ධන ක්‍රියාකාරකම වන පාංශු සංරක්ෂණ වැඩසටහන තුලින් ලබා ඇති කාර්ය සාධනය 98 % කි. මෙම වැඩසටහනට සමගාමී අනෙක් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් ප්‍රගතිය 90 % ක් විය. අයහපත් කාලගුණික හා ක්ෂේත්‍ර කටයුතුවලදී මුහුණ පෑමට සිදු වූ තාක්ෂණික නිලධාරින්ගේ හිඟතාවය වැනි හේතු නිසාවෙන් ඉලක්ක ගත ප්‍රගතිය කරා ලඟාවීමට අපහසු විය. එසේ වුවද මානව හා භෞතික සම්පත් මනා ලෙස කළමණාකරණය කිරිම තුල මෙම ප්‍රගතිය අත්කර ගැනීමට හැකියාව ලැබී ඇත.

2014 සංවර්ධන වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 70 ක මුදලක් අධිකාරිය වෙත වෙන් කරන ලද අතර එම මුදලින් රුපියල් මිලියන 63.237 වැය කර අදාල සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරිම තුල 90.33 % ක මුල්‍යමය කාර්ය සාධනයක් ලබාගැනීමට අවස්ථාව ලැබී ඇත. මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් මෙම මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2014 වර්ෂය තුල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා වෙන්කරන ලද මුදල රුපියල් මිලියන 12.01 කි. මෙම මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝගි කර ගනිමින් 2014 වර්ෂය තුල මාතර දිස්ත්‍රික්කයේ වාණිජ කොරටු වගා සංවර්ධන ව්‍යාපෘතිය, කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරිමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදි. මෙම සමස්ත සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි කරගෙන ඇති ගොවීන් සංඛ්‍යාව 20,000 ට ආසන්නය. මෙම සියළුම වැඩසටහන් තුලින් ඉඩම් පරිහරණය, භෝග වගාව, කාබනික පොහොර නිෂ්පාදනය යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම සහිත පුද්ගලයන් බිහි කිරිම සඳහා අවශ්‍ය මැදිහත්වීමේ කාර්ය භාරය ඉටු කිරිමට ශ්‍රී ලංකා හදබිම අධිකාරියට හැකිවීම පිළිබඳ මා අතිශයින් සතුටු වෙමි. එලෙසම මෙම කාර්යය තුලින් පරිසර සංරක්ෂණ ක්‍රියාවලියට ලබාදෙන ලද දායකත්වය මැනිය නොහැක. මෙම සමස්ත ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා මෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මැතිතුමා විසින් අපහට ලබාදෙන ලද නායකත්වය හා මගපෙන්වීම ඉතා ප්‍රශංසනීය වන අතරම අමාත්‍යාංශයේ සියළුම නිලධාරින්ගේද විශාල සහයෝගයක් අප වෙත ලබා දෙන ලදි.

එලෙසම මෙම සංවර්ධන වැඩසටහන ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමේදි සහයෝගය ලබා දෙන ලද අධිකාරියේ විධායක අධ්‍යක්ෂවරයා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට ද මාගේ කෘතවේදිත්වය පිරිනැමීමට කැමැත්තෙමි.

නන්දසේන හේරත්
සභාපති
ශ්‍රී ලංකා හදබිම අධිකාරිය



**විධායක අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය**

දිවයිනේ ප්‍රධාන ගංගා ද්‍රෝණි 103 ආරම්භය සනිටුහන්වන මධ්‍යම කඳුකරය පාරිසරික ලෙස ඉතා සංවේදී කලාපයකි. ගලා හැලෙන සෑම ගංගාවකම ධාරිතාවය තීරණය වනුයේ මෙම ජලපෝෂක ප්‍රදේශයේ පැවැත්ම මතය. එසේ වුවද ඈත අතීතයේ ඉතා සමතුලිතව පැවැති මෙම පරිසර පද්ධතිය යටත් විජිත යුගයේ සිට ආරම්භ වූ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අසමතුලිත වී ඇති අතර ප්‍රදේශයේ ඉඩම් පද්ධති පාංශු ඛාදනය හේතුවෙන් නිසරු ආන්තික ඉඩම් බවට පත්ව ඇත.

මෙම පරිසර අසමතුලිතාවය ජාතික පාරිසරික ගැටළුවක් බවට පත් වූ අවස්ථාවන් හඳුනාගත් විද්වතුන් එම තත්ත්වය අවම කිරීම සඳහා ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහනක අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි. ඒ අනුව මෙම කාර්‍යයට උරදීම සඳහා ජාතික කෘෂිකාර්මික විවිධාංගිකරණ හා ජනපද සංවර්ධන අධිකාරිය (නැඩ්සා) ආයතනය ආරම්භ විය. 1972 වර්ෂයේ ආරම්භ වූ මෙම ආයතනය ගතවූ දශක තුනක කාලයක් තුල විවිධ විකාශන අවධීන් පසු කරමින් මේවන විට ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ලෙසින් මෙම පාරිසරික සංරක්ෂණ මෙහෙවර ඉටුකරමින් සිටී.

වර්තමානයේ මහා භාණ්ඩාගාරයේ මූල්‍යමය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන මෙම ආයතනය, කඳුකර ප්‍රදේශ පාදකව ජීවත්වන ගොවි ප්‍රජාවගේ සහභාගීත්වය තුල ආන්තික තත්ත්වයට පත් ඉඩම් සංරක්ෂණය කරමින් කෘෂිකාර්මික ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරනු ලබයි. එමගින් ආන්තික තත්ත්වයට පත් මෙම ඉඩම් පද්ධති ඵලදායි නිෂ්පාදන ඒකක බවට පත් කිරීම සඳහා උත්සහ කරනු ලබයි. 2014 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබාදුන් රුපියල් මිලියන 70 ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝගී කර ගනිමින් ගොවි පවුල් 8326 කට අයත් හෙක්ටෙයාර් 3925.2 ක ඉඩම් ප්‍රමාණයක් සංරක්ෂණය කරන ලදි. මෙම ඉලක්කයන් සපුරාගත් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මෙම ඉඩම්වල කෘෂි නිෂ්පාදන අධිකාරියේ මැදිහත්වීම මත මිලට ගෙන අලෙවි කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අතුරින් ගොවීන්හට කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිළක් ලබා ගැනීමටත් නාගරික පාරිභෝගිකයන් සඳහා නැවුම් කෘෂි නිෂ්පාදන සහන මිළට ගැනීම සඳහා අවශ්‍ය අවකාශය සැලසී ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන අතරින් පාරිසරික සංරක්ෂණ කාර්යයට ඍජු ලෙසම මැදිහත්වන ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම ඇමතිතුමා මෙන්ම අමාත්‍යාංශයේ ලේකම්තුමා ලබාදුන් සහයෝගය අගය කල යුතුව ඇත. එලෙසම කෘෂිකර්ම අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන්ද 2014 ඉලක්ක ගත වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා විශාල සහයෝගයක් ලබාදෙන ලදි. එලෙසම වැඩසටහනෙහි සාර්ථකත්වය උදෙසා කටයුතු කල අධිකාරියේ සභාපති නන්දසේන හේරත් මහතා ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයද කෘතවේදීව සිහිපත් කරමි.

ජේ.සි.රණේපුර
විධායක අධ්‍යක්ෂ

# දැක්ම

" සරු පසින් සරු පොළොවක්
සරු පොළොවෙන් සරු සාර
අස්වැන්නක් සපිරි රටක් "

## මෙහෙවර

" පාංශු බාදනය වලකා
පාංශු සංරක්ෂණය තුලින්
භූමිය සරු කර සරු ඵල ගන්වා
දේශීය ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර
දේශීය කෘෂි නිෂ්පාදන
ඉහළ දැමීමට හවුල් වීම "

# හැඳින්වීම

1972 අංක 11 දරණ කෘෂිකර්ම නීතිගත සංස්ථා පනත අනුව 1978 වර්ෂයේදී ජාතික කෘෂිකර්ම විවිධාංගිකරණ හා ජනපද අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලද (නැඩිසා) ආයතනය සඳහා පහත සඳහන් බලතල පවරා දෙන ලදි.

1. කෘෂිකර්ම විවිධාංගිකරණ හා ජනපද ජලාධාර ප්‍රදේශ කළමණාකරනය.
2. ආයතනය වෙත පවරා ඇති ඉඩම් පද්ධතීන්ගෙන් උපරිම ඵලදායිතාව ලබා ගැනීම සඳහා පරිසර කළමණාකරණය හා ජල සංරක්ෂණය.
3. කෘෂිකර්ම නිෂ්පාදන සැකසීම හා අලෙවිය සඳහා මැදිහත්වීම.
4. කෘෂිකර්ම විවිධාංගිකරණය හා ජනාවාස සංවර්ධනය සඳහා වන උපකරණ සැපයීම හා නඩත්තු කිරීම.

ඉහත බලතල උපයෝගි කර ගනිමින් අධිකාරියේ සංවර්ධන කටයුතු 1978 වර්ෂයේ ආරම්භ කරන ලද අතර පළමු අදියර යටතේ මහවැලි ගඟ ආශ්‍රිත මහා ජල පෝෂක ප්‍රදේශවලට අයත් වඩාත් සංවේදී පරිසර කලාපයන් තුල හා කෑගල්ල දිස්ත්‍රික්කයේ මාඔය ගඟ ආශ්‍රිත ප්‍රදේශයට අයත් ජල පෝෂක ප්‍රදේශය තුලින් සංරක්ෂණ කටයුතු ආරම්භ කරන ලදි. එහිදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් පාංශු ඛාදනය හේතුවෙන් ආන්තික තත්ත්වයට පත් ඉඩම් අක්කර 5000 ක් සංරක්ෂණය සඳහා ඉලක්ක ගත විය. මෙම ඉඩම් සංවර්ධන හා සංරක්ෂණ කටයුතු සඳහා ලෝක ආහාර සංවිධානය ආධාර සපයන ලදි.

යටත් විජිත සමය තුල මෙම ප්‍රදේශවල ඉතා සශ්‍රික වූ වන ගහනය විනාශ වී වැවිලි බෝග ආදේශ වීම තුල හා යටත් විජිත යුගය නිමාව සමග පාංශුඛාදනය හා පාංශු හායනය හේතුවෙන් ආන්තික බවට පත් මෙම ඉඩම් පද්ධති හේතුවෙන් ප්‍රදේශයේ අසමතුලිතතාවය ජාතික පරිසර ගැටළුවක් බවට පත් විය. මෙම තත්ත්වය වඩාත් අයහපත් ලෙස බලපෑම් ඇති කරන ලද්දේ සිව් ප්‍රදේශයෙන් මහසයුර සමග එක්වන ප්‍රධාන ගංගා 103 මෙම සංවේදී පරිසර කලාපයෙන් ආරම්භ වෙන නිසාවෙන්ය.

ඒ අනුව මෙම ප්‍රදේශයේ පරිසර සංරක්ෂණය උදෙසා එම ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවගේ සහභාගීත්වය උපරිම ලෙස ලබා ගනිමින් ඉලක්ක ගත අක්කර 5000 ක ප්‍රමාණය ඵලදායි නිෂ්පාදන ඒකක බවට පත් කරන ලදි. ව්‍යාපෘති කාල සීමාවන් අවසන් වීමත් සමගම මෙම ව්‍යාපෘතිය පිළිබඳ පාරිසරික ශක්‍යතා අධ්‍යනයක් සිදු කරන ලද අතර එහි නිර්දේශය වූයේ මෙම ව්‍යාපෘතිය තුලින් අරමුණු කල අපේක්ෂාවන් සඵල වී ඇති බැවින් ව්‍යාපෘතිය තව දුරටත් ක්‍රියාත්මක කරමින් ව්‍යාපෘති බල ප්‍රදේශ තව දුරටත් පුළුල් කිරීම ජාතික අවශ්‍යතාවයක් බවය.

ඒ අනුව 1991 වර්ෂයේ සිට (නැඩිසා) ආයතනයේ නිල නාමය "ශ්‍රී ලංකා හරිත දනව් බිම් සංවර්ධන මධ්‍යම අධිකාරිය", "ශ්‍රී ලංකා හදබිම අධිකාරිය" ලෙස සංශෝධනය කරන ලද අතර මධ්‍යම කඳුකරය හා ඒ ආශ්‍රිත වූ දිස්ත්‍රික්ක වන මොණරාගල, බදුල්ල, නුවරඑළිය, රත්නපුර, මාතලේ, කෑගල්ල හා මහනුවර යන දිස්ත්‍රික්ක ව්‍යාපෘති ප්‍රදේශ ලෙස නම් කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක ආහාර සංවිධානයේ ආධාර ලබා ගන්නා ලදි. ලෝක ආහාර ආධාර අවසන් වූ පසු මෙම අධිකාරියේ කාර්‍යභාරය පවත්වාගෙන යාම මහාභාණ්ඩාගාරය වෙත පවරා ගන්නා ලද්දේ ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩ ලෙස පවත්වා ගෙනයාම අරමුණු කර ගනිමින්ය. පසු කාලීනව කුරුණෑගල, මාතර හා ගාල්ල යන දිස්ත්‍රික්ක සඳහා ද හදබිම අධිකාරියේ කටයුතු ව්‍යාප්ත කරන ලදි.

ඒ අනුව 2014 වර්ෂයේ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය විසින් මහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලද ක්‍රියාත්මක සැලැස්ම අනුව ප්‍රාග්ධන වියදම් ලෙස රුපියල් මිලියන 70 ක් හා පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 47 ක් අනුමත කරන ලදි. මෙම මුල්‍ය ප්‍රතිපාදන උපයෝගි කරගනිමින් 2014 වර්ෂයේ මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 40 ක් ආවරණය වන පරිදි ගොවි පවුල් 12500 ගේ සහභාගීත්වය ලබා ගනිමින් හෙක්ටෙයාර් 4000 ක භූමි ප්‍රමාණයක් සංරක්ෂණය කර සංවර්ධනය කිරිම ඉලක්ක ගත විය.

ඒ අනුව අධිකාරියේ අරමුණු හා පරමාර්ථ සඵල කර ගැනීම ඉලක්ක කර ගනිමින් 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ සමස්ත ක්‍රියාකාරකම් පිළිබඳ අත්කර ගන්නා ලද ප්‍රගතිය මෙම කාර්ය සාධන සටහන තුලින් ඉදිරිපත් කිරිම අපේක්ෂාවයි.

# පාලන අංශයේ තොරතුරු

# ශ්‍රී ලංකා හඳුනාගත් අධිකාරිය

<u>අධ්‍යක්ෂ මණ්ඩලය:</u>

| | | |
|---|---|---|
| 1. නන්දසේන හේරත් මහතා | - | සභාපති |
| 2. ලලිත් රෝහණ නානායක්කාර මහතා | - | සාමාජික |
| 3. බුද්ධි රාමවික්‍රම මහතා | - | සාමාජික |
| 4. රන්ජන් ධර්මවර්ධන මහතා | - | සාමාජික |
| 5. එච්.එම්.ගාමිණී සෙනෙවිරත්න මහතා | - | සාමාජික |
| 6. කේ.ඒ.සමන්ත මහතා | - | සාමාජික |
| 7. එස්.කේ.ධම්මික මහතා | - | සාමාජික |

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත ලෙස පත්ව සිටි විමල් එස්.කේ.ලියනගම මහතා 2014.01.03 දින සිට රේගු දෙපාර්තමේන්තුවට ස්ථාන මාරුවක් ලැබීම හේතුවෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉවත්ව යන ලදී.

ඒ සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් එච්.එම්.ගාමිණී සෙනෙවිරත්න මහතා මැයි මස සිට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත ලෙස පත් කරන ලදී.

අධිකාරියේ නියෝජ්‍ය සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ලෙස පත්කර සිටි ලලිත් රෝහණ නානායක්කාර මහතා 2014.07.31 දින අධිකාරියෙන් ඉවත්ව යන ලදී.

2014 අගෝස්තු 07 වන දින සිටි අධිකාරියේ නියෝජ්‍ය සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල සමාජික ලෙස එස්.කේ.ධම්මික මහතා වැඩ භාර ගන්නා ලදී.

<u>කාර්ය මණ්ඩල විස්තර</u>

1. අධිකාරියේ සභාපති ලෙස නන්දසේන හේරත් මහතා සේවයේ නියුතු අතර නියෝජ්‍ය සභාපති ලෙස සේවය කල ලලිත් රෝහණ නානායක්කාර මහතා 2014.07.31 වන දින දක්වාත් 2014.08.07 වන දින සිට 2014-12-31 දින දක්වා එස්.කේ.ධම්මික මහතාත් සේවය කරන ලදී.

2. අධිකාරියේ විධායක අධ්‍යක්ෂ ලෙස සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ( I පංතියේ) තිලක් ගාමිණී මුණසිංහ මහතා 2014.07.30 දින සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරේක දිසාපති (ඉඩම්) තනතුර සඳහා ඉවත්ව යන ලදී.

3. පුරප්පාඩු වූ විධායක අධ්‍යක්ෂ තනතුර සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ පාලන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජේ.සී.රණේපුර මහතා 2014.08.11 දින රාජකාරී භාරගන්නා ලදී.

4. නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරේ වැඩ බැලූ කෘෂිකර්ම නිළධාරී බී.එම්.ඒ.බී.දසනායක මහතා 2014.10.01 දින සිට එම තනතුරේ ස්ථිර කරන ලදී.

5. ගිණුම් අංශයේ මුල්‍ය නිළධාරී තනතුරේ රාජකාරී ඉටු කරන ඒ.වී.හේමලතා මහත්මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ රාජකාරී ආවරණය කරන ලදී.

6. 2014 වර්ෂයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර පුරප්පාඩුව තිබුණි.

# ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ
# කාර්ය මණ්ඩල විස්තර -2014-12-31 දිනට

| අනු අංකය | තනතුරු නාමය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | සභාපති | 1 | 1 | - |
| 02 | නියෝජ්‍ය සභාපති | 1 | 1 | - |
| 03 | විධායක අධ්‍යක්ෂ | 1 | 1 | - |
| 04 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) | 1 | - | 1 |
| 05 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) | 1 | 1 | - |
| 06 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) | 1 | - | 1 |
| 07 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවි) | 1 | 1 | - |
| 08 | සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා සැළසුම්) | 1 | - | 1 |
| 09 | පරිපාලන නිලධාරි | 1 | 1 | - |
| 10 | මූල්‍ය නිලධාරි | 1 | 1 | - |
| 11 | අලෙවි නිලධාරි | 1 | 1 | - |
| 12 | කෘෂිකර්ම සංවර්ධන නිලධාරි | 2 | 1 | 1 |
| 13 | අභ්‍යන්තර විගණන නිලධාරි | 1 | - | 1 |
| 14 | කලාප නිලධාරි | 8 | 8 | - |
| 15 | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 25 | 25 | - |
| 16 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ) | 17 | 17 | - |
| 17 | සරප් | 1 | 1 | - |
| 18 | යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 1 | - |
| 19 | ශ්‍රව්‍ය දෘෂ්‍ය සහායක | 1 | 1 | - |
| 20 | රියදුරු | 14 | 11 | 3 |
| 21 | කාර්යාල කාර්යය සහායක | 4 | 4 | - |
| 22 | රිය සහායක | 2 | 2 | - |
| 23 | මුරකරු | 4 | 4 | - |
| 24 | කම්කරු | 2 | 2 | - |
| එකතුව | | **93** | **85** | **8** |

E;Harshani/Manel/ Carder

## ශ්‍රී ලංකා හදබිම අධිකාරිය
## 2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

| නිලධාරීන්ගේ නම | පැවැත්වූ දින හා සහභාගීත්වය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014-01-31 | 2014-02-25 | 2014-03-31 | 2014-04-29 | 2014-05-19 | 2014-06-26 | 2014-07-28 | 2014-08-22 | 2014-09-29 | 2014-10-27 | 2014-11-28 | 2014-12-30 |
| නන්දසේන හේරත් මහතා<br>සභාපති<br>ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| ලලිත් රෝහණ නානායක්කාර මහතා<br>උප සභාපති<br>ශ්‍රී ලංකා හදබිම අධිකාරිය | X | √ | √ | √ | √ | √ | √ | - | - | - | - | - |
| බුද්ධි රාමවික්‍රම මහතා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| රන්ජන් ධර්මවර්ධන මහතා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ | √ | √ | X | √ | √ | √ | √ | √ | √ | √ |
| නීතිඥ එම්.පී. ජයසිංහ මහතා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | X | √ | √ | √ | √ | √ | X | √ | √ | √ | √ | √ |
| කේ.ඒ. සමන්ත මහතා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ | √ |
| එච්.එම්. ගාමිණී සෙනවිරත්න මහතා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | - | - | - | √ | √ | √ | √ | X | √ | √ | √ |
| එස්.කේ. ධම්මික මහතා<br>අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | - | - | - | - | - | - | √ | √ | √ | √ | √ |

ඇත :- √

නැත :- X

# ශ්‍රී ලංකා හදබිම අධිකාරිය

## සංවිධාන ව්‍යුහය



# සංවර්ධන වැඩසටහන

| අනු අංකය | වැඩසටහන | ව්‍යාපෘතිය | | ඒකකය | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) |
| 1 | පාංශු සංරක්ෂණය හා දියබෙත්ම කළමණාකරනය | i. | මූලික සංරක්ෂණ සැළසුම්කරණය | වැඩසටහන් | 80 | 0.4 | 80 | 0.38 |
| | | ii. | ප්‍රජා නායකත්ව සංවර්ධන වැඩසටහන | වැඩසටහන් | 7 | 0.91 | 7 | 0.906 |
| | | iii. | පාංශු සංරක්ෂණය පිළිබඳ පුහුණුව | වැඩසටහන් | 80 | 0.4 | 80 | 0.359 |
| | | iv. | පාංශු සංරක්ෂණය සඳහා කෘෂි උපකරණ ලබාදීම | උදලුතල | 12500 | 8.45 | 8326 | 6.098 |
| | | v | පාංශු සංරක්ෂණ වැඩසටහන | හෙක්. | 4000 | 30 | 3920 | 29.439 |
| 2 | ඉඩම් හා භෝග කළමණාකරණය | i. | තාක්ෂණික පුහුණුව | වැඩසටහන් | 80 | 0.4 | 59 | 0.342 |
| | | iii. | බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දීම | හෙක්. | 625 | 5.875 | 331.5 | 4.653 |
| 3 | කාබනික පොහොර නිෂ්පාදනය | i. | කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික පුහුණුව | වැඩසටහන් | 80 | 0.4 | 80 | 0.326 |
| | | ii. | කෘෂි උපකරණ ලබාදීම | | 6500 | 4.575 | 4512 | 3.195 |
| | | iii. | කාබනික පොහොර නිෂ්පාදනය | මෙ.ටො. | 6000 | - | 6500 | - |
| 4 | අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන | i. | කුකුල් පැටවුන් ලබාදීම | කුකුල් පැටව් | 10000 | 3.755 | 9520 | 3.55 |
| 5 | පාසැල් පරිසර වැඩසටහන | ii. | පාසැල් ආදර්ශ වැඩසටහන | ආදර්ශ | 50 | 0.5 | 50 | 0.459 |
| 6 | "තරුණ අරුණ" තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | | | තරුණ තරුණියන් | 1000 | 0.25 | 1000 | 0.0905 |
| මුළු එකතුව | | | | | | **55.915** | | **49.798** |

## 01. පාංශු සංරක්ෂණ හා දියබෙත්ම කළමණාකරණය

අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛතම සංවර්ධන කාර්යය ලෙස ඉලක්ක ගත වූයේ සංවේදි පරිසර කලාප තුල පාංශු ඛාදන තත්ත්වය අවම කිරිමට කටයුතු කිරිමයි. 2014 වර්ෂයේ මෙම කාර්ය සඳහා ඉලක්ක ගත වුයේ ගොවි පවුල් 12500 ක සහභාගීත්වය ඇතිව හෙක්ටෙයාර් 4000 ක භූමි ප්‍රමාණයකි. පාංශු ඛාදනය හා පාංශු හායනය හේතුවෙන් ආන්තික බවට පත් මෙම ඉඩම් ප්‍රමාණය ඵලදායි නිෂ්පාදන ඒකක බවට පත් කරමින් ප්‍රදේශයේ පරිසර අසමතුලිතතාවය අවම කිරිම සඳහා මෙහි සඳහන් ඉලක්ක ගත සංවර්ධන වැඩසටහන් 2014 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලදි.

### 01. i. ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණය

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශ සහිතව හඳුනා ගනු ලබන ගම්මානවලට උචිත සංරක්ෂණ සැලැස්ම සකස් කිරිම සඳහා ප්‍රජාවගේ සහභාගීත්වය ලබා ගැනීම අරමුණු කරගනිමින් ග්‍රාමීය ලෙස සංවිධානය කරනු ලබන අවිධිමත් සාකච්ඡාමය වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලදි. ඒ අනුව මෙවැනි ක්ෂේත්‍ර වැඩසටහන් 80 ක් ඉලක්ක කරන ලදි. ඉලක්ක ගත වැඩසටහන් 80 ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩසටහන් තුලින් ලබාගත් ප්‍රගතිය පහත පරිදිය.





| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු.මි. |
| වැඩසටහන් 80 | 0.4 | වැඩසටහන් 80 | 0.38 |
| සහභාගීත්වය 12500 | | සහභාගීත්වය 11400 | |

01. ii. **ප්‍රජා නායකත්ව සංවර්ධනය**

ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය පරිසර සංරක්ෂණය හා ඉඩම් සංවර්ධන වැඩසටහන් හුදෙක් ක්‍රියාත්මක කරනුයේ එම ප්‍රදේශවල ගොවි ප්‍රජාවගේ සහභාගීත්වය උපරිම මට්ටමකින් ලබා ගනිමින්ය. මෙම ග්‍රාමීය ශ්‍රමසම්පත මනා ලෙස කළමණාකරණය කිරීම සඳහා මැදිහත්කරුවන් ලෙස එම ගම්මාන තුලින්ම ග්‍රාමීය නායකයන් හඳුනා ගැනීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණයි.

ඉලක්ක ගත ප්‍රදේශවල උගත් රැකියා වියුක්ත තරුණ තරුණියන් හඳුනා ගෙන ඔවුන් සඳහා නායකත්ව සංවර්ධනය, සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය , නායකත්ව ගුණාංග හා මානව සම්පත් සම්බන්ධිකරණය වැනි විෂය කරුණු පිළිබඳ විධිමත් පුහුණුවක් ලබාදිමෙන් පසු ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ සහායක කණ්ඩායමක් ලෙස ඔවුන් අනුයුක්ත කරනු ලබයි. ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ ක්ෂේත්‍ර කළමණාකරුවන්ට සහායවන මෙම සහායකයන් අධිකාරියේ ක්‍රියාකාරකම් ඉලක්ක ගත කාල පරාසවල සිදු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙනු ලබයි. ඒ අනුව 2014 වර්ෂයේ මෙම වැඩසටහන තුලින් අත්කර ගත් ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. |
| වැඩසටහන් 07 | 0.91 | වැඩසටහන් 07 | 0.906 |
| ප්‍රජා නියාමකයින් 400 | | ප්‍රජා නියාමකයින් 360 | |



01. iii. **පාංශු සංරක්ෂණය පිළිබඳ තාක්ෂණික පුහුණුව**

දිර්ඝ කාලයක් තුල පාංශු බාදන හා පාංශු හායනය යන අයහපත් පාරිසරික ක්‍රියාවලි සිදුවීම තුල නිසරු බවට පත් මෙම ඉඩම් නැවත ප්‍රතිනිර්මාණය කිරීමට නම් ඉහත තත්ත්වයන් අවම කිරීම අත්‍යාවශ්‍ය කාර්යයකි. මෙම කාර්ය සිදු කිරීම සඳහා සහභාගීත්ව මානව සම්පත මනා ලෙස උපයෝජනය කල යුතුව ඇත. ඒ සඳහා මෙම කාර්යන් පිළිබඳ නිර්දේශිත නව තාක්ෂණයන් හඳුන්වාදීමත් පාරිසරික සංරක්ෂණ කාර්යන් පිළිබඳ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමත් අත්‍යාවශ්‍ය වේ. මෙම අරමුණු ඉලක්ක කර ගනිමින් පාංශු සංරක්ෂණය පිළිබඳ ක්ෂේත්‍ර මට්ටමින් පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලබයි. මෙහිදි පාංශු සංරක්ෂණය පිළිබඳ නවීණ තාක්ෂණය පිළිබඳ න්‍යාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම සිදු කරනු ලබයි. ඒ අනුව 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද මෙම ක්ෂේත්‍ර වැඩසටහන් තුලින් ලබාගත් ප්‍රගතිය පහත පරිදිය.

| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු. මි. |
| වැඩසටහන් 80 | 0.400 | වැඩසටහන් 80 | 0.359 |
| ගොවි පවුල් 12500 | | ගොවි පවුල් 10250 | |



## 01. iv. පාංශු සංරක්ෂණ කටයුතු සඳහා කෘෂි උපකරණ ලබාදීම

ඉලක්ක ගත ප්‍රදේශ තුල ගොවි ප්‍රජාව හුදෙක් අඩු ආදායම් හා එම මට්ටමෙහි පසුවන ගොවීන්ය. ඔවුන්ගේ ශ්‍රම සම්පත උයෝජනය සඳහා කිසියම් නෛතික දිරිගැන්වීම් කල යුතුව ඇත. එම සංකල්පයට අනුව සෑම ගොවියෙකු සඳහා කෘෂි උපකරණයක් ලෙස උදළු තලයක් ලබා දිමට 2014 සංවර්ධන වර්ෂය තුල කටයුතු සංවිධානය කරන ලදි. එම වැඩසටහන ක්‍රියාත්මක කිරිම තුලින් ලබාගත් ප්‍රගතිය පහත සඳහන් ප





| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මුල්‍ය රු.මි. | භෞතික | මුල්‍ය රු.මි. |
| උදළු තල 12500 | 8.45 | උදළු තල 8326 | 6.098 |
| ගොවි පවුල් 12500 | | ගොවි පවුල් 8326 | |

### 01. v. පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම

තම ඉඩම් ඒකකය තුල සිදුවන පාංශු ඛාදන තත්ත්වය අවම කිරීම සඳහා වඩාත් විද්‍යාත්මකව පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම සඳහා ගොවි ප්‍රජාව යොමු ගත කරනු ලබන තම ඉඩම් ඒකකයේ භූවිෂමතාවයට අනුව යෙදිය හැකි සංරක්ෂණ ක්‍රම පිළිබඳ ඉහත පුහුණු සැසිය තුලින් ලබාගත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම භාවිතයට ගෙන ගොවීන් විසින් මෙම කාර්ය ඉටු කරනු ලබයි. අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරින්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මෙම සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම එන්.ආර්.එම්.සි. (NRMC) ආයතනයේ නිර්දේශවලට අනුව සිදු කරනු ලබයි. මේ අනුව නිර්දේශිත සංරක්ෂණ ක්‍රම වන යාන්ත්‍රික, ජීව විද්‍යාත්මක හා ශෂ්‍ය විද්‍යාත්මක සංරක්ෂණ ක්‍රම මේ සඳහා උපයෝගි කර ගනු ලබයි.





ඉහත සඳහන් කල පරිදි ඉලක්ක ගත ගොවි ප්‍රජාවගේ ශ්‍රමය මේ සඳහා උපයෝජනය කිරීම සඳහා මැදිහත්කරුවෙකු මෙන්ම කිසියම් සහනාධාර ලබාදෙමින් ඔවුන්ගේ දිරිගැන්වීම කල යුතුය. මේ සඳහා අන් වසරවල මෙන්ම 2014 වර්ෂයේදි පාංශු සංරක්ෂණ ව්‍යුහ ස්ථාපිත කිරීම වෙනුවෙන් එක් ගොවි පවුලක් සඳහා හෙක්ටෙයාර් 01 ක ඉඩම් ප්‍රමාණයක් සංරක්ෂණය කිරීම වෙනුවෙන් රුපියල් 10,000.00 ක සහනාධාරයක් ලබා දෙන ලදි. හෙක්ටෙයාර 01 ක් සංරක්ෂණය කිරීම සඳහා එන්.ආර්.එම්.සි. (NRMC) ආයතනයේ ගණනය කිරීම වෙනුවෙන් රුපියල් 50,000.00 ක් 60,000.00 ක මුදලකට ශ්‍රම සම්පතක් වැය වුවද අධිකාරිය විසින් ගෙවීමට කටයුතු කරන ලද්දේ රුපියල් 10,000.00 මුදලක්ය. එම මුදලින් 10 % වැනි මුදලකි. ඒ අනුව 2014 වර්ෂයේ මෙම සංවර්ධන ක්‍රියාකාරකම තුලින් ලබාගත් භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. |
| හෙක්ටෙයාර් 4000 | 30.0 | හෙක්ටෙයාර් 3925.2 | 29.439 |
| ගොවි පවුල් 12500 | | ගොවි පවුල් 10000 | |

## 02. ඉඩම් හා බෝග කළමණාකරණ වැඩසටහන

පාංශු සංරක්ෂණ කටයුතු නිම කරන ලද ඉඩම් ඒකක තිරසාර සංරක්ෂණය උදෙසා එම ඉඩම් ඵලදායි නිෂ්පාදන ඒකක බවට පත් කිරීම කාලීනව අත්‍යවශ්‍ය කරුණකි. මෙ ඉඩම් තුල විනාශ වී ගිය ආවරණය නැවත ස්ථාපිත කිරීම සඳහා ක්‍රමවත් බෝග රටාවක් ආදේශ කිරීමට කටයුතු කරනු ලබයි. මේ සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිර්ඝ කාලීන බෝග හඳුන්වා දීමට කටයුතු කරන ලදි. මෙම අරමුණු සඵල කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් 2014 වර්ෂය තුල ඉටු කරන ලදි.

### 2. i. ඉඩම් හා බෝග කළමණාකරණය පිළිබඳ තාක්ෂණික පුහුණුව

පාංශු සංරක්ෂණය හා පාංශු පුනරුත්ථාපනය කිරීමෙන් පසුව බෝග වගාව සඳහා සුදුසු තත්ත්වයට පත් මෙම ඉඩම් තුල ක්‍රමවත් බෝග රටාවක් හඳුන්වා දීම සඳහා ගොවි ප්‍රජාව තාක්ෂණිකව දැනුවත් කිරීම සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම පුහුණු වැඩසටහන් තුලින් බෝග වගාව, නඩත්තුව හා ඉඩම් පරිහරණය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබාදෙන ලදි. මෙම වැඩසටහන තුලින් 2014 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. |
| වැඩසටහන් 80 | 0.400 | වැඩසටහන් 59 | 0.342 |
| සහභාගීත්වය 6500 | | සහභාගීත්වය 5422 | |

### 2. ii. බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදිමේ වැඩසටහන

බෝග වගා කිරීමේ වැඩසටහන සඳහා දිරිගැන්වීමක් ලෙස බීජ හා රෝපණ ද්‍රව්‍ය යම් ප්‍රමාණයක් ගොවි ප්‍රජාව සඳහා නොමිලේ ලබාදීමට 2014 සංවර්ධන වර්ෂය තුල කටයුතු කරන ලද අතර මේ සඳහා රුපියල් මිලියන 5.875 වෙන් කල අතර රුපියල් මිලියන 4.653 වියදම් කර පහත සඳහන් පරිදි රෝපණ ද්‍රව්‍ය ගොවීන් වෙත ලබාදෙන ලදි.

| බීජ වර්ගය | ප්‍රමාණය කි.ග්‍රෑ. |
|---|---|
| මිරිස් | 161 |
| කුරක්කං | 141 |
| කව්පි | 823 |
| උඳු | 66 |
| හවරි මෑ | 809 |
| බණ්ඩක්කා | 216 |
| වම්බටු | 79 |
| දඹල | 70 |
| කහ බීජ | 14225 |



## 03. කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන

### i. කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික පුහුණුව

ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මඟින් 2014 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ හඳුනාගනු ලැබූ ගොවීන් සඳහා වඩාත් විද්‍යානුකූල ක්‍රම වේදයකට අනුව කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය නව තාක්ෂණික දැනුම ලබාදීම අරමුණු කරගනිමින් ක්ෂේත්‍ර ගොවි පුහුණු වැඩසටහන් 80 ක් සංවිධානය කිරීමට පියවර ගත් අතර එම පුහුණු වැඩසටහන් 80 නිම කිරීමට කටයුතු කර ඇත. මේ සඳහා වර්ෂයේ අයවැය තුලින් රුපියල් මිලියන 0.400 ක් වෙන් කල අතර රුපියල් මිලියන 0.326 මුදලක් වැය කර පුහුණු වැඩසටහන් අවසන් කර ඇත. ඒ අනුව භෞතික ප්‍රගතිය 100 % කි.



### ii. කෘෂි උපකරණ ලබාදීම

කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන උපදෙස් පරිදි නිමකල ගොවීන් සඳහා සවල් එක බැගින් ලබාදීමට කටයුතු කරන ලද අතර මෙම කාර්ය සඳහා රුපියල් මිලියන 4.875 මුදලක් වෙන් කල අතර රුපියල් මිලියන 3.195 ක මුදලක් වැයකර ගොවීන් 4512 ක් සඳහා සවල් 4512 ලබා දෙන ලදි.

### iii. කාබනික පොහොර නිෂ්පාදනය

මෙම ව්‍යාපෘතියේ මූලික ඉලක්කය වූයේ ප්‍රතිලාභීන් 4000 ගේ සහභාගීත්වයෙන් කාබනික පොහොර මෙට්‍රික් ටොන් 6500 ක් නිෂ්පාදනය කර එම ගොවීන්ගේ වගා කටයුතු සඳහා භාවිතා කිරීමයි. ඒ අනුව ඉලක්ක ගත වර්ෂය වන විට එම ඉලක්කය සපුරා ගැනීමට හැකියාව ලැබුණි.





## 04. අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් සඳහා දායක කරනු ලබන ගොවි ප්‍රජාව ඔවුන් ලබන අඩු ආදායම් තත්ත්වයන් හේතුවෙන් විශේෂයෙන් ඔවුන්ගේ දූ දරුවන් අඩු පෝෂණ තත්ත්වයට මුහුණ දී ඇත. අවශ්‍ය ප්‍රෝටීනමය ආහාර සුලභ නොවීම මෙම තත්ත්වයට හේතුව ලෙස බලපා ඇත. මෙම තත්ත්වය අවම කිරිමත් ග්‍රාමීය ආදායම් උත්පාදන හැකියාවන් වර්ධනය සඳහාත් අවධානය යොමු කරමින් අර්ධ ගෘහාශ්‍රිත කුකුල් පාලන වැඩසටහන 2014 වර්ෂයේ ද ක්‍රියාත්මක කරන ලදි. ගම්මාන මට්ටමින් හඳුනා ගත් ගොවි පවුල් සඳහා අඩ නිදැලි ක්‍රමයට නඩත්තු කල හැකි කුකුල් පැටවුන් මසක් පෝෂණය කර ගොවීන් සඳහා නොමිලේ ලබාදීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදි. 2014 වර්ෂය තුල මෙම වැඩසටහන තුලින් ලබාගත් ප්‍රගතිය පහත පරිදි වේ.





<table>
<tr><th colspan="2">ඉලක්කය</th><th colspan="2">ප්‍රගතිය</th></tr>
<tr><th>භෞතික</th><th>මූල්‍ය රු.මි.</th><th>භෞතික</th><th>මූල්‍ය රු.මි.</th></tr>
<tr><td>පැටවුන් 10000</td><td rowspan="2">3.755</td><td>පැටවුන් 9520</td><td rowspan="2">3.550</td></tr>
<tr><td>ගොවි පවුල් 1000</td><td>ගොවි පවුල් 952</td></tr>
</table>

## 05. පාසැල් පාරිසරික වැඩසටහන

ස්වාභාවික සම්පත් කළමණාකරනය, පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුම හා ආකල්ප පාසැල් දරුවන් වෙත රැගෙන යාම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද මෙම වැඩසටහන තුලින් පාරිසරික සංරක්ෂණය පිලිබඳ ආදර්ශයක් ලබාදීමට කටයුතු කරන ලදි.





පාසැල් භූමිය තුල පාංශු සංරක්ෂණ ආදර්ශයක් ස්ථාපිත කිරීම තුලින් පාංශු සංරක්ෂණය පිළිබඳ ප්‍රායෝගික දැනුම පාසැල් ප්‍රජාව සඳහා ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. 2014 වර්ෂය තුල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින් ලබාගත් ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු.මි. | භෞතික | මූල්‍ය රු.මි. |
| පුහුණු වැඩසටහන් 50 | 0.5 | පුහුණු වැඩසටහන් 50 | 0.459 |
| ආදර්ශන ඒකක 50 | | ආදර්ශන ඒකක 50 | |

## 06. "තරුණ අරුණ" තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලාංකික කෘෂිකර්ම ක්ෂේත්‍රය සංවර්ධනයේදී හමුවන ප්‍රධාන අභියෝගයක් වනුයේ තරුණ ප්‍රජාව සීඝ්‍ර ලෙස කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයෙන් ඈත් වීමයි. සමස්තයක් ලෙස ගත්කල කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිරත පිරිස 30 % දක්වා පහත වැටී ඇත. මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව කෘෂිකර්මාන්තය ලාභදායි ව්‍යාපාරයක් නොවීමය. තවද කෘෂිකර්මාන්තය පිළිගත් රැකියාවක් නොවන බවට වූ සමාජ සම්මතය ද හේතු වී ඇත. ඒ අනුව මෙම තත්ත්වය අවම කිරීම සඳහා ග්‍රාමීය තරුණ තරුණියන් සඳහා කෘෂිකර්මාන්තයේ නව තාක්ෂණයන් හඳුන්වා දිය යුතුය. එලෙස ඔවුන්ගේ කෘෂි නිෂ්පාදන සඳහා සුදුසු වෙළඳපොලක් හඳුන්වා දීම කල යුතුය. මෙම අරමුණු සඵල කර ගැනීමේ අරමුණින් 2014 වර්ෂය තුල ශ්‍රී ලංකා හදබිම අධිකාරිය තරුණ අරුණ නමින් විශේෂ තරුණ ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව එම වැඩසටහන තුලින් අත්කරගත් ප්‍රගතිය පහත සඳහන් පරිදිය.

| ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|
| භෞතික | මූල්‍ය රු. මි. | භෞතික | මූල්‍ය රු.මි. |
| තරුණ තරුණියන් 1000 | 0.250 | 1000 | 0.0905 |

## 07. කෘෂි නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ මැදිහත්වීම මත සංවර්ධනය කරනු ලබන ඉඩම් ඒකක තුල නිෂ්පාදන අතරමැදියන්ගේ මැදිහත්වීමකින් තොරව අලෙවි කර ගැනීමේ ගැටළුව සඳහා සාර්ථක ලෙස මුහුණ දීමේ අරමුණින් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය ආරම්භ කර ඇති කෘෂි නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කරමින් අවශ්‍ය යටිතල පහසුකම් සැපයිම සඳහා 2014 වර්ෂයේද කටයුතු කරන ලදි. ඒ අනුව මාතර දිස්ත්‍රික්කයේ වැලිගම අලෙවිසැල හා කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරියේ නව අලෙවි ඒකක ස්ථාපිත කිරිම සඳහා අවශ්‍ය ඉදිකිරිම් කටයුතු ආරම්භ කරන ලදි.





මෙම කාර්ය සඳහා 2014 සංවර්ධන යෝජනා තුලින් වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 5.586 ක් වන අතර එම මුදලින් රුපියල් මිලියන 5.585 වැය කර අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි.

## 08. ව්‍යවසායකත්ව සංවර්ධනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව මෙම වැඩසටහන ඉලක්ක කර ගනිමින් ව්‍යවසායකයන් බිහි කිරිමට අධිකාරිය 2014 වර්ෂයේද කටයුතු කරන ලදි. අවශ්‍ය තාක්ෂණික පුහුණුව ලබාදීම තුලින් ඔවුන් ග්‍රාමීය ආදායම් උත්පාදකයන් බවට පත් කිරිම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදි. මෙම කාර්ය සඳහා 2014 වර්ෂයේ අයවැය යෝජනා තුලින් වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 0.800 ක් වන අතර එම මුදලින් රුපියල් මිලියන 0.536 ක් වැය කර අදාල ක්‍රියාකාරකම් ඉටු කර ඇත.

## 09. මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සේවයේ නියැලෙන ක්ෂේත්‍ර හා කාර්යාලීය කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ කාර්ය බද්ධ කුසලතාවය හා දැනුම වර්ධනය කිරිමට පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි. මෙහිදි විෂයානුබද්ධ ආයතනවල තාක්ෂණික සහයෝගිතාවය ලබා ගන්නා ලදි. 2014 වර්ෂය තුල මෙම කාර්ය සඳහා වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 0.3 වන අතර මෙම මුදලින් රුපියල් මිලියන 0.137 වැය කර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

## 10. මාධ්‍ය හා ප්‍රචාරක වැඩසටහන්

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සමස්ත සංවර්ධන වැඩසටහන් පිළිබඳව ජාතික තලය දැනුවත් කිරීම අරමුණු කරගනිමින් 2014 වර්ෂයේ විවිධ මුද්‍රිත හා මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙම කාර්ය සඳහා 2014 වර්ෂයේ වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 2.0 වන අතර මෙම මුදලින් රුපියල් මිලියන 1.928 වැය කර මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

## 11. ප්‍රගති මෙහෙයුම් වැඩසටහන්

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සමස්ත සංවර්ධන වැඩසටහන පිළිබඳව වූ ප්‍රගතිය මාසිකව මෙන්ම වාර්ෂිකවද සමාලෝචනයට ලක් කිරීම සඳහා කටයුතු කරන ලදි.

## 12. ආයතනික සංවර්ධනය

ආයතනයේ සමස්ත සංවර්ධන වැඩසටහන මෙහෙයවනු ලබන ප්‍රධාන කාර්යාලය සතු භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා 2014 වර්ෂයේද අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලද අතර මෙම කාර්ය සඳහා රුපියල් මිලියන 1.994 වෙන් කරන ලදී. මෙම මුදලින් රුපියල් මිලියන 1.918 වැය කර අධිකාරිය සතු භෞතික සම්පත් නඩත්තු කටයුතු හා නව මිලදී ගැනීම් සිදුකරන ලදි.

## 13. විශේෂ සංවර්ධන ව්‍යාපෘති

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සඳහා මහා භාණ්ඩාගාර මුල්‍ය ප්‍රතිපාදනවලට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ලබාදෙන මුල්‍යමය ප්‍රතිපාදන උපයෝගි කරගනිමින් විශේෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. 2014 වර්ෂයේ එලෙස ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය පහත සඳහන් කර ඇත.

### i. "මිහිසරු" කාබනික පොහොර නිෂ්පාදන හා භාවිතය ප්‍රචලිත කිරීමේ වැඩසටහන

රසායනික පොහොර භාවිතය 25% කින් අවම කිරීමේ ජාතික වැඩසටහනට සමගාමී ලෙස ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා මාතර දිස්ත්‍රික්කයෙන් තෝරා ගන්නා ලද ගොවීන් ගණන 4000 කි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ උප ක්‍රියාකාරකම් ලෙස පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි.





තාක්ෂණික පුහුණු වැඩසටහන ගොවීන් 4000 ක් සඳහා කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ නව තාක්ෂණයන් ලබාදීම අරමුණු කරගනිමින් තාක්ෂණික පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලද අතර මෙම කාර්ය සඳහා වැය කරන ලද මුදල රුපියල් මිලියන 0.235 කි.

- **කෘෂි උපකරණ ලබාදීම**

කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අදාල ගොවීන් යොමු ගත කිරීම සඳහා කෘෂි උපකරණයක් ලෙස උදළු තලය බැගින් ලබාදීමට කටයුතු කරන ලද අතර මෙම කාර්ය සඳහා රුපියල් මිලියන 2.439 ක මුදලක් වැයකර උදළු තල ගොවීන් 4000 ක් අතරේ බෙදා දී ඇත.

- **කාබනික පොහොර නිෂ්පාදනය**

මෙම ව්‍යාපෘතියේ මූලික ඉලක්කය වූයේ ප්‍රතිලාභීන් 4000 ගේ සහභාගීත්වයෙන් කාබනික පොහොර මෙට්‍රික් ටොන් 8000 ක් නිෂ්පාදනය කර එම ගොවීන්ගේ වගා කටයුතු සඳහා භාවිතා කිරීමයි. ඒ අනුව ඉලක්ක ගත වර්ෂය වන විට එම ඉලක්කය සපුරා ගැනීමට හැකියාව ලැබුණි. මෙම සමස්ත ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 3.502 ක මුදලක් වෙන් කරන ලද අතර මෙම මුදලින් රුපියල් මිලියන 2.777 වැය කර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කටයුතු කර ඇත.

ii. "දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනයට සමගාමී දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම - කුරුණෑගල දිස්ත්‍රික්කය

- **අතිරේක ආහාර බෝග සුලභ කිරීමේ ව්‍යාපෘතිය**

2014 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට සමගාමීව මෙම දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන වැඩසටහනට සමගාමීව ගනේවත්ත හා ඉබ්බාගමුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2 ක ගොවීන් 1000 ගේ අක්කර 1000 ක ඉඩම් ප්‍රමාණයක් තුල අතිරේක ආහාර බෝග වගා කිරීමට කටයුතු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා හඳුනාගත් ගොවීන් සඳහා විෂයානුබද්ධ තාක්ෂණික පුහුණු වැඩසටහන් 10 ක් සංවිධානය කරමින් ගොවි පවුල් 1000 ක් සඳහා ක්ෂේත්‍රය පිළිබඳ නව තාක්ෂණයන් ලබාදීමට කටයුතු කරන ලදි.





තවද මෙම ගොවීන් සඳහා අතිරේක ආහාර බෝග බීජ ලබාදීමට කටයුතු කරන ලද අතර මුං බීජ කිලෝග්‍රෑම් 2500, මිරිස් බීජ කිලෝග්‍රෑම් 50 මිළදී ගෙන මෙම ගොවීන් අතර බෙදා දීමට කටයුතු කර ඇත. මෙම සමස්ථ ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේ වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 1.236 ක් වන අතර මෙම මුදලින් රුපියල් මිලියන 1.104 ක මුදලක් වැය කර ව්‍යාපෘතියේ කටයුතු සාර්ථක ලෙස අවසන් කර ඇත.

## ii. මානුෂීය කෘෂි සත්කාරය අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන - i පියවර

පසුගිය යුධමය වතාවරණය හේතුවෙන් අවතැන් වුවන් සඳහා නැවත පදිංචි කිරිම සිදුකරන ලද වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැළෑබෝගස්වැව ගම්මානය හා අවට ගම්මාන 5 ක් තුල මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.





මුලික දැනුවත් කිරිම් සඳහා ක්ෂේත්‍ර ගොවි හමු 02 ක් තුලින් ගොවි පවුල් 300 ක් සඳහා තාක්ෂණික පුහුණුව ලබා දීමට කටයුතු කල අතර සෑම ගොවි පවුලක් සඳහාම කෘෂි උපකරණ කට්ටලයක් ලබාදීමට කටයුතු කරන ලදි. එලෙස ලබාදෙන ලද උදළු තල ගණන 300 කි. මෙම ප්‍රතිලාභවලට අමතරව සෑම ගොවි මහතෙකුටම අතිරේක ආහාර බෝග බීජ නොමිලේ ලබාදීමට කටයුතු කරන ලදි. ඒ අනුව මුං කිලෝග්‍රෑම් 652, කව්පි බීජ කිලෝග්‍රෑම් 54 හා මීරිස් බීජ කිලෝග්‍රෑම් 25 ක් මෙම ව්‍යාපෘතිය තුල බෙදා දෙන ලදි. මෙම සමස්ථ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1.251 වෙන් කරන ලද අතර මෙම මුදලින් රුපියල් මිලියන 0.974 ක් වැය කර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇත.

### iii. මානුෂීය කෘෂි සත්කාරය අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන - ii පියවර

ඉහත වැඩසටහනෙහි දෙවන පියවර ලෙස කැළෑබෝගස් වැව, වෙහෙරගල, නන්දිමිත්‍ර ගම හා නාමල්ගම යන නැවත පදිංචිකරන ලද ගොවි පවුල් 1000 ක් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර ගොවීන් සඳහා කෘෂි උපකරණ කට්ටලයක් බැගින් ලබාදෙන ලදි. අතිරේක ආහාර බෝග බීජ ලෙස මිරිස් කිලෝග්‍රෑම් 100, කව්පි කිලෝග්‍රෑම් 1250, රටකජු කිලෝග්‍රෑම් 1000, මුං කිලෝග්‍රෑම් 1198 ක් මෙලෙස නැවත පදිංචි කරන ලද ගොවි පවුල් 1000 ක් සඳහා බෙදා දෙන ලදි.





### iv. වාණිජ කොරටු වගා ව්‍යාපෘතිය

2014 වර්ෂයේදී මාතර දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද අරමුණ වූයේ මෙම ප්‍රදේශයේ ජීවත්වන ගොවීන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන කොරටු වගා වැඩසටහන් තාක්ෂණික ලෙස මැදිහත්ව එම වගා කටයුතු සංවර්ධනය කිරිමයි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා හඳුනා ගත් ගොවි පවුල් ගණන 3000 ක් පමණ වේ.

මෙම සියළු ගොවීන් සඳහා වාණිජ කොරටු වගා සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම අධිකාරිය මඟින් ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කරන ලද ගොවි පුහුණු වැඩසටහන් මඟින් ලබාදීමට කටයුතු කරන ලදි. එලෙස සෑම ගොවි පවුලකටම කොරටුවගාව සඳහා අවශ්‍ය බීජ කට්ටලයක් බැගින් නොමිලේ ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන තුලින් වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 3.450 ක් වූ අතර එම මුදලින් රුපියල් මිලියන 3.311 ක් වැය කර ව්‍යාපෘතියේ කටයුතු ඉලක්ක ගත වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට පෙර අවසන් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය මඟින් ඉලක්ක ගත ප්‍රජාවගේ තාක්ෂණික දැනුම වර්ධනය කිරිමට හැකි වූ අතර ඔවුන්ගේ ආදායම් තත්ත්වයේද වර්ධනයක් දක්නට හැකි විය.

# අලෙවි ව්‍යාපෘතිය

# පාරිභෝගික සේවාව

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව ක්ෂේත්‍රයෙන් බිහිවු ගොවි සංවිධාන වලින් ලබා ගන්නා අස්වැන්න පසු අස්වනු හානිය අවම කරමින් ආරක්ෂිත ඇසුරුම්වල බහා රැගෙන එනු ලබයි .එම කෘෂි ද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර නැවත තත්ව පරික්ෂාවකට ලක්කර නැවුම් සහ ගුණත්වයෙන් සපිරි කෘෂි ද්‍රව්‍ය මිලදි ගැනිම සිදු කරනු ලබයි. එම කෘෂි ද්‍රව්‍ය සහනදායි මිලට අලෙවි කිරීම සිදු කරන අතර, සාම්ප්‍රදායික ආහාර හඳුන්වා දීමක් සිදු වන අතරම ප්‍රචලිත වීමක්ද සිදු වේ. අලෙවියෙන් පසු ඉතිරි වන කෘෂි ද්‍රව්‍ය හදබිම ගොවිපලවල් වලට කොම්පෝස්ට් පොහොර සඳහා ද, විශ්ව විද්‍යාලයේ ගොවිපලවල සත්ව ආහාර සඳහා ද නිකුත් කරනු ලබන්නේ අපතය ආර්ථිකයට ඵලදායි ලෙස යොදා ගැනීම සඳහායි. මෙම සියළු කාර්‍ය රාජ්‍ය ආයතනයකින් ඉටුවිය යුතු වගකීම උපරිම ලෙස ඉටු කිරීමට සඳහා සේවා පරිසරයක් තුල සුහදශීලි පාරිභෝගික සත්කාරයක් සහිතව පවත්වාගෙන යනු ලබන්නේ අප අලෙවි ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටුවන ආකාරයෙනි.

## අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියේ අරමුණු

01 වස විසෙන් තොර කෘෂි නිෂ්පාදන ඉහල නැංවීමට ගොවිප්‍රජාව පෙළඹවීම.

02 ග්‍රාමීය කෘෂි නිෂ්පාදන සඳහා ගොවියාට ඉහළ මිලක් ලබාදීම.

03 නාගරික පාරිභෝගිකයාට උසස් ප්‍රමිතියකින් යුත් කෘෂි නිෂ්පාදන සැපයීම හා සාම්ප්‍රදායික ආහාර නිෂ්පාදන ප්‍රචලිත කිරීමට කටයුතු යෙදීම.

04 පසු අස්වනු හානිය අවම කිරීමට කටයුතු යෙදීම.

05 ග්‍රාමීය තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබාදීම.

## අභිමතාර්ථ

